

## ජයන්ත චන්ද්‍රසිරි සිනමා නිර්මාණයක්
## අර්ජුන් කමලනාත් නිෂ්පාදනයක්

# ෂරසරප

Australian Distribution by TIMARA ENTERTAINMENT

SYDNEY – 16th of Sept 2018. 6.30pm @ READING CINEMAS, Rouse Hill NSW 2155

"මම ඔබේ අඳුරු අවිඥානයේ සොඳුරු ප්‍රතිබිම්බය වෙමි. විශ්වාසයේ සහ අවිශ්වාසයේ ඉම කොතැනක වුව, යථාර්තයෙන් පිටත යැයි සිතා ඔව්හු යතාර්ථය වෙතම දිව ගියහ"



**ජයන්ත චන්ද්‍රසිරි** නිර්මාණශීලී අධ්‍යක්ෂක

**මම කාගෙවත් සිනමාව මගේ කරගන්න ගියේ නැහැ.මම හැම තිස්සෙම අපේ රටේ ප්‍රේක්ෂකයෝ ගැන විශ්වාස කරලා චිත්‍රපට හදපු නිර්මාණකරුවෙක්"**



**අර්ජුන කමලනාත්** නිෂ්පාදනය

**"මගේ රංගන ජීවිතයට අවුරුදු විස්සයි.විස්සට කරපු හොඳම වැඩේ මේක.ජයන්ත චන්ද්‍රසිරි කියන අධ්‍යක්ෂකවරයා එක්ක වැඩක් කරන්න ලැබීමම මගේ භාග්‍යයක් සේ සලකනවා.**

**ගී පද රචනා**
ජයත්න චන්ද්‍රසිරි
**ගායනය**
සමිතා එරන්දති මුදුන්කොටුව,
භාචි සුසාන්, දුමාල් වර්ණකුලසූරිය
**නර්තන නිර්මාණය** - ගයාන් ශ්‍රීමාල්
**දෘශ්‍ය ප්‍රයෝග** - අනුජ බාසුරු
**නිෂ්පාදන සම්බන්ධීකරණය** - හේමන්ත රන්දුනු
**නිෂ්පාදන කළමනාකරණය** - අජිත් ප්‍රනාන්දු
**සහාය අධ්‍යක්ෂණය** - නිමල් ෆ්‍රැන්සිස් සහ සරත් සේනාරත්න
**කලා අධ්‍යක්ෂණය** - පියතිස්ස අකුරම්බොඩ
**අංග රචනය** - ඉන්දික උදර ලංකා
**ශබ්ද සංයෝජනය, වර්ණ සංකලනය සහ සංස්කරණය** - දිලාන් ගුණවර්ධන
**සංගීත අධ්‍යක්ෂණය** - චින්තක ජයකොඩි
**කැමරා අධ්‍යක්ෂණය** - ප්‍රභාත් රෝෂන්

## ෂරසරප හැඩ කරන නළු නිළියන්

**ජැක්සන් ඇන්තනී, කමල් අද්දරආරච්චි, ශ්‍රීයන්ත මෙන්ඩිස්, සංගීතා වීරරත්න, යශෝධා විමලධර්ම, අමීශා කාවින්දි, කුසුම් රේණු, වසන්ත විට්ටච්චි, කාවින්ද්‍යා අධිකාරී, දෙවුනක පෝරගේ, ජයනාත් බෝදුහන්දි, රජිත හිරාන්, අයිශාරා අතුකෝරාල, අනුර ධර්මසිරිවර්ධන, මියුරි සමරසිංහ, සේනක ටයිටස්, ගාමිණී ජයලත්, සඳුන් බණ්ඩාර, හේමන්ත රන්දුනු, චතුර පෙරේරා, සංජීව දිසානායක, මහේන්ද්‍ර වීරරත්න, තිස්ස ගුණතිලක, උපතිස්ස බාලසූරිය, ජයරත්න ගලගෙදර, උපුල් මහානාම, ලක්ෂ්මන් රාජපක්ෂ, නෝමන් පළිහවඩන, අතුල ජයතිස්ස.**

### ශ්‍රියන්ත මෙන්ඩිස්

"අතීතයේ අපේ කළබලකාරී ප්‍රේමනීය සිතිවිලි ධාරාව වර්තමානයට භාවනා-වක් සේ විඳින්නට, භාවනාවක් සේ දකින්නට, සිත ඇතුලේ අභ්‍යන්තරයේ සතපන්නට ඔහු ෂරසරප හරහා අපට යෝජනා කරනවා"

### සංගීතා වීරරත්න

"මම හිතන්නේ මගේ උපරිමයෙන් මම කරලා තියෙනවා.ඒක බෙහොම ආදරණීය ලෙස ප්‍රේක්ෂකයන්ට භාර කරනවා"

### සමිතා එරන්දතී මුදුන්කොටුව

ෂරසරප චිත්‍රපටියේ පසුබිම් ගීතය ගැන "අම්මා කෙනෙක් දුවත් එක්ක නොකරපු දෙයක් එයාගේ දුවත් එක්ක කරලා"

### මහාචාර්ය ජේ.බී දිසානායක

"හදවතට දැනුනා මේ ආදරය කියන්නේ,ප්‍රේමය කියන්නේ මොන තරම් පාරිශුද්ධ සුන්දර වස්තුවක්ද කියලා"

කල්දෙමුල්ල

නව යොවුන් වියේ පසුවන සඳරැස් එදිරිසිංහ ගඩාගම දේවස්ථානයට යන්නේ තම ග්‍රාම සගයා වූ අන්තෝනිගේ ආරක්ෂකයා වශයෙනි. එහෙත් වරින් වර වැලඳෙන යක්ෂාරූඩයකින් පීඩා විඳින අන්තෝනි සුව කර ගැනීමේ වගකීම භාර ගත් ඔහුගේ මිත්තණියගේ බලවත් විශ්වාසය වූ එම දේවස්ථා-නයේ සති අන්ත සුව මෙහෙයට ඔහු අත්‍යන්තයෙන්ම නවකයෙකු වෙයි.

නවකයා නැවුම් මිනිසෙකි.ඔහුට මේ ගමනේදී නැවුම් ප්‍රේමයක් සම්මුණ නොවී තිබෙයිද? ප්‍රශ්නය නම් මේ යොවුන් පෙම්බරිය එනම් විද්‍යා යක්ෂාරූඩයකින් පීඩා විඳීමයි.විශේෂය නම් ඇය වසාගත් යක්ෂයා ස්ත්‍රීන්ට පමණක්ම ලොල් වඩන සුප්‍රකට කළු කුමාර යක්ෂයා වීමයි.ස්ත්‍රීන් විෂයෙහි අතිශය බලපෑම් සහගත ආලවන්තයෙකු වශයෙන් ප්‍රේම ක්‍රීඩාවෙහි නිරත කළු කුමාරයා විද්‍යා කෙරෙහි කෙතරම් ආසක්තව සිටින්නේද යත් ඇය මෙම අතවරයෙන් මුදි ගැනීමට උත්සාහ කරන ඕනෑම කෙනෙකුට ඔහු අභියෝග කරනු සුළුය.

සුවපත් කිරීම අරමුණු කරගෙන ආතුරයන් ප්‍රලය කරවන සුව මෙහෙය තුළ එදා ඇය ප්‍රලය නොවන්නේ ඇයගේ සිතට රිංගා ගෙන සිටින සඳරැස් නිසාය.ළාබාල යුවතියගේ හඳමඬල සටන් බිම වශයෙන් ගෙන සිදු කරෙන මේ නූතන යක්ෂ - මිනිස් සටනින් අවසානයේ මිනිස් කොලුවා ජය ලබන්නේ කළු කුමාරයාගේ ද ගෞරවය ද ලබමිනි.

එහෙත් කළු කුමාරායාටද වඩා බලවත් සමාජ දේශපාලනික තත්වයන් විසින් නොපමාව වෙන්කරවන ලද යොවුන් ප්‍රේමවන්තයෝ අහිමි ආදරය දලුලා වැඩෙන්නට ඉඩ හරිමින් එකිනෙකාගෙන් වියෝ වන්නේ කාලය නමැති ස්වභාවික අකාරුණාවේ සරදමට ලක් වෙමිනි.
වසර තිස් හතක් ගෙවී යයි.විද්‍යා, සඳරැස් අද වන විට සමාජයේ පිළිගත් දෙදෙනෙකි. ඔවුන් දෙදෙනා යළි මුණ ගැසෙයි.ඒ මුණ ගැසීම සිදු කරන්නේ කළු කුමාර යක්ෂයාය.

මෙකී කතා පුවත අන්තර්ගත වන්නේ ජයන්ත චන්ද්‍රසිරි නමැති සම්මානනීය අධ්‍යක්ෂකවරයාගේ ෂරසරප නමැති ඔහුගේ නවතම සිනමාපටයටය.වෙනස් අන්දමේ සිනමා සිතුවම් ඔබ වෙත ගෙන එන ජයන්තගේ එම සිනමා සිතුවම අර්ජුන කමලනාත්ගේ නිෂ්පාදනයකි.මෙහි කතාව,දෙබස්,තිර රචනය ද ජයන්ත විසින් නිම කොට තිබේ.

**සරසවිය ජුනි 28**





Melbourne Show - 23 rd Sept 2018
2.30/6pm @ Cinema Monash University

නිර්මාණශීලී අධ්‍යක්ෂක **ජයත්න චන්ද්‍රසිරි** සමග චිත්‍රපට නළු නිෂ්පාදක **අර්ජුන කමලනාත්** ඔස්ට්‍රේලියාවේ තිරගතවීම් වලට සහභාගීවීමට නියමිතය.